# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1997 අංක 4 දරන
## බදු සහ විදේශ විනිමය සමා පනත

---

[සහතිකය සටහන් කළේ 1997 අප්‍රේල් මස 29 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 මැයි මස 02 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 9.00 යි. තැපැල් ගාස්තුව : රු. 4.60 යි.

# 1997 අංක 4 දරන බදු සහ විදේශ විනිමය සමා පනත

[සහතිකය සටහන් කලේ 1997 අප්‍රේල් මස 29 වන දින]

එල්. ඩී.–ඕ. 3/97.

තැනැත්තකු විසින් ආදායම් පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කර නොමැත්තා වූ හෝ ආදායම් බදු පැනවීමට අදාළ නීතිය යටතේ එම තැනැත්තා විසින් සැපයිය යුතු වාර්තාවක හෙළිදරව් කර නොමැත්තා වූ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත රඳවාගෙන ඇති සමුච්චිත ලාභ සහ ආදායම දැක්වෙන මුදල් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත තැනැත්තකු විසින් රඳවාගෙන ඇති සහ එම තැන්පතුවේ කාර්ය සඳහා ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කර ඇති අදාල විදේශ ව්‍යවහාර මුදල් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ගිණුම්වල තැන්පත් කිරීමට අවස්ථාව සැලසීම පිණිස ද, එම විශේෂ ගිණුම්වල තැන්පත් කරන ලද මුදල් නිශ්චිත කාර්යයන් සඳහා ආපසු ලබා ගැනීමට අවස්ථාව සැලසීම පිණිස ද, තැනැත්තන් අනාගතයේ දී බදු නීතිවලට සහ විනිමය පාලනයට අදාල නීතිවලට සම්පූර්ණයෙන් අනුකූලව කටයුතු කිරීම සුරක්ෂිත කිරීමේ අදහසින් එම තැනැත්තන් ඇතැම් බදු ගෙවීමට යටත්වීමෙන් එම බදු නීතිවලට සහ විනිමය පාලන නීතිවලට අදාල වූ වැරදි සඳහා නඩු පවරනු ලැබීමෙන් සහ දණ්ඩනවලින් ආරක්ෂා කරනු පිණිස ද, ඒවාට සම්බන්ධ වූ හෝ ආනුෂංගික කරුණු සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

**ලුහුඩු නාමය.**

1. මේ පනත 1997 අංක 4 දරන බදු සහ විදේශ විනිමය සමා පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**මේ පනත අදාළ වන තැනැත්තන්.**

2. (1) (2) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත්ව මේ පනත–

(අ) ආදායම් බදු පැනවීමට අදාළව තත් කාලයෙහි බලපවත්නා නීතිය යටතේ 1996 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර ලැබුණු හෝ උපචිත වූ යම් ලාභ සහ ආදායම වෙනුවෙන්, 1996 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු හෝ ආදායම් බදු මත අධිභාරයක් ගෙවීමට යටත් වන්නා වූ ද එකී යම් තක්සේරු වර්ෂයක් සඳහා එම නීතියේ විධිවිධාන යටතේ ආදායම් වාර්තාවක් සපයා නොමැත්තා වූ හෝ එකී යම් තක්සේරු වර්ෂයක් සඳහා එම පනතේ විධිවිධාන යටතේ තමා විසින් සපයන ලද යම් වාර්තාවක එම ලාභ හෝ ආදායම හෙළිදරව් කිරීම පැහැර හැර ඇත්තා වූ ; හෝ

1—D 043237—6,375 (97/02)

(ආ) ශ්‍රී ලංකාවෙන් පිටත යම් අදාළ විදේශ ව්‍යවහාර මුදල් දරන්නා වූ

යම් තැනැත්තකුට අදාළ විය යුතු ය.

(2) මේ පනත-

(අ) 1996 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර තමාට ලැබුණු හෝ උපචිත වූ හෝ ව්‍යුත්පන්න වූ අවස්ථාවෝචිත පරිදි, යම් ලාභ සහ ආදායම හෝ පිරිවැටුම් සම්බන්ධයෙන් ආදායම් බදු පැනවීමට තත්කාලයෙහි අදාළ නීතිය හෝ 1963 අංක 11 දරන මුදල් පනත හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත හෝ 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත යටතේ ගෙවිය යුතු යම් බද්දක් මග හරිනු ලැබුවේ යයි කියනු ලැබීමක් හෝ සැක කරනු ලැබීමක් ; හෝ

(ආ) විනිමය පාලන පනතේ හෝ 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනතේ යම් විධිවිධානයක් උල්ලංඝනය කළේ යැයි කියනු ලැබීමක් හෝ සැක කරනු ලැබීමක්

පිළිබඳව යම් විමර්ශනයක් 1997 පෙබරවාරි මස 15 වන දින නොනිමිව පවතින්නේ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද ඒ තැනැත්තාට අදාළ නොවිය යුතු ය.

(3) (2) වන උපවගන්තියේ සඳහන් නොවන (1) වන උපවගන්තියේ සඳහන් සෑම තැනැත්තකුම මේ පනතේ මින් මතු "මේ පනත අදාළ වන තැනැත්තකු" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

මේ පනත අදාළ වන තැනැත්තන් විසින් බැංකුවෙහි විශේෂ ගිණුම්වල මුදල් තැන්පත් කළ හැකි බව.

3. මේ පනත අදාළ වන-

(අ) 1996 මාර්තු මස 31 වන දින හෝ ඊට පෙර අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමුච්චිත ලාභ හෝ ආදායම දැක්වෙන්නා වූ ද ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත (අදාළ විදේශ ව්‍යවහාර මුදල් නොවන) යම් මුදල් ඇත්තා වූ ද ඒ සම්බන්ධයෙන් ආදායම් වාර්තාවක් සපයා නොමැත්තා වූ ද ආදායම් බද්දට හෝ ආදායම් බදු මත අධිභාරයට තත්කාලයේ අදාළ වන නීතිය යටතේ ඔහු විසින් ඉදිරිපත් කරන ලද ආදායම් වාර්තාවල එම මුදල හෙළිදරව් කර නොමැත්තා වූ ; හෝ

(ආ) යම් අදාළ විදේශ ව්‍යවහාර මුදල් දරන්නා වූ තැනැත්තකු, (අ) ඡේදයේ සඳහන් එම මුදල් සම්බන්ධයෙන් වන විට 1997 පෙබරවාරි මස 15 වන දින හෝ ඊට පසුව නමුත් 1997 අගෝස්තු මස 15 වන දිනට පෙර බැංකුවේ එම කාර්යය සඳහා ඔහු විසින් විවෘත කළ විශේෂ ගිණුමක තැන්පත් කිරීම හෝ පරිවර්තනය කර තැන්පත් කිරීම කළ හැකි අතර (ආ) ඡේදයේ සඳහන් අදාළ විදේශ ව්‍යවහාර මුදල් සම්බන්ධයෙන් වූ විට1997 පෙබරවාරි මස 15 වන දින හෝ ඊට පසුව නමුත් 1997 අගෝස්තු මස 15 වන දිනට පෙර බැංකුවේ එම කාර්යය සඳහා ඔහු විසින් විවෘත කළ විශේෂ ගිණුමක ඔහුගේ බැරට පරිවර්තනය කර තැන්පත් කළ හැකි ය.

තැන්පත්කරුවන් විසින් සැපයිය යුතු ප්‍රකාශ.

4. (1) 3 වන වගන්තියේ විධිවිධාන යටතේ බැංකුවේ විශේෂ ගිණුමක යම් මුදල් තැන්පත් කරන සෑම තැනැත්තකුම, මේ පනතේ උපලේඛනයේ දක්වා ඇති ආකෘතියෙහි බැංකුව වෙත ප්‍රකාශයක් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ බැංකුව වෙත කර ඇති සෑම ප්‍රකාශයකම පිටපතක් බැංකුව විසින් කොමසාරිස් ජනරාල්වරයාට ප්‍රේෂණය කිරීමට සැලැස්විය යුතු අතර පරිවර්තනය කර තැන්පත් කරන ලද යම් විදේශ ව්‍යවහාර මුදල් සම්බන්ධයෙන් කරන ලද ප්‍රකාශයක් සම්බන්ධයෙන් වූ විට බැංකුව විසින් එම ප්‍රකාශයේ පිටපතක් ද විනිමය පාලකවරයාට ප්‍රේෂණය කිරීමට සැලැස්විය යුතු ය.

විශේෂ ගිණුම්වල තැන්පත් කර ලද මුදල් ආපසු ලබා ගැනීම සීමා කිරීම.

5. 3 වන වගන්තියෙහි සඳහන් පරිදි වූ එවැනි යම් විශේෂ ගිණුමක මුදල් තැන්පත් කර ඇති යම් තැනැත්තකුට, 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අතුරු විධානයේ නිශ්චිතව සඳහන් කාර්යයන් සඳහා ද එසේ සඳහන් කාලසීමාවට පසුව ද හැර, එම තැන්පතුව කළ දිනයෙන් අවුරුදු දෙකක කාලසීමාවක් ගතවීමට පෙර එම විශේෂ ගිණුමෙහි එම තැනැත්තාගේ බැරට ඇති සම්පූර්ණ මුදල හෝ ඉන් කොටසක් හෝ (එම මුදලට එකතු වන පොලිය හැර) ආපසු ලබා ගැනීමට, වෙනත් යම් නීතියක කුමක් සඳහන්ව ඇත ද, බැංකුව විසින් ඉඩ නොදිය යුතු ය.

විශේෂ ගිණුම්වල තැන්පත් කරන ලද මුදල් ආපසු ලබා ගත හැකි කාර්යයන්.

6. (1) 3 වන වගන්තියෙහි සඳහන් යම් විශේෂ ගිණුමක මුදල් තැන්පත් කර ඇති යම් තැනැත්තකු විසින්, ඔහු තැන්පතුව කළ දිනයෙන් අවුරුදු දෙකක් ගත වූ පසුව එම විශේෂ ගිණුමේ ඔහුගේ බැරට ඇති ඉතිරි මුදල ආපසු ලබාගත හැකි ය :

කෙසේ වුවද කොමසාරිස් ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ විට ඒ තැනැත්තා විසින්, ඔහු තැන්පතුව කළ දිනයෙන් එක් මාසයක කාලයක් ඉකුත් වූ පසු එම ඉතිරි මුදල සම්පූර්ණයන්ම හෝ ඉන් කොටසක්, යම් රජයේ අධිකාරියක් විසින් හෝ යම් පළාත් පාලන ආයතනයක් විසින් හෝ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් නියි ලෙස බලය දෙන ලද ව්‍යාවසායක් හෝ පහසුකමක් වන්නා වූ ද කෘෂිකාර්මික හෝ කාර්මික ව්‍යවසායක හෝ අධෝව්‍යුහය දියුණු කිරීම සඳහා වූ ව්‍යවසායක හෝ පහසුකමක ආයෝජනය කිරීම සඳහා ආපසු ලබා ගත හැකි ය.

(2) 3 වන වගන්තියෙහි සඳහන් යම් විශේෂ ගිණුමක තමාගේ බැරට තිබෙන මුදල් (1) වන උපවගන්තියේ අතුරු විධානයේ නිශ්චිතව සඳහන් යම් කාර්යයක් සඳහා, ඔහු තැන්පතුව කළ දිනයෙන් එක් මාසයක් ගතවීමට පසු ආපසු ලබාගන්නා යම් තැනැත්තකු, එම මුදල් ආපසු ලබාගත් කාර්යය සඳහා එම මුදල් යෙදවීම පැහැර හැරියහොත් එම තැනැත්තා මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, ආපසු ලබාගන්නා ලද මුදලට සමාන මුදලකට සහ රුපියල් එක් ලක්ෂයකට නොවැඩි ගණනක දඩයකට ඔහු යටත් විය යුතු ය.

(3) යම් තැනැත්තකු, ඔහු තැන්පතුව කළ දිනයෙන් එක් මාසයක කාලයක් ඉකුත්වීමෙන් පසු 3 වන වගන්තියේ සඳහන් එවැනි යම් විශේෂ ගිණුමක ඔහුගේ බැරට ඇති යම් මුදල් (1) වන උපවගන්තියේ අතුරු විධානයේ නිශ්චිතව සඳහන් කාර්යවලින් යම් කාර්යයක් සඳහා ආපසු ලබාගන්නා අවස්ථාවක, එවැනි සෑම ආපසු ලබාගැනීමක් පිළිබඳවම විස්තර කොමසාරිස් ජනරාල්වරයාට යැවීමට බැංකුව විසින් සැලැස්විය යුතු ය.

විශේෂ ගිණුම්වල තැන්පත් කරන ලද මුදල් සඳහා පොළිය.

7. 3 වන වගන්තියෙහි සඳහන් යම් විශේෂ ගිණුමක යම් තැනැත්තකුගේ බැරට තිබෙන මුදල සම්බන්ධයෙන්, වෙනත් ඉතිරි කිරීමේ ගිණුම්වල බැරට ඇති මුදල් මත බැංකුව විසින් ගෙවිය යුතු පවත්නා පොළී අනුප්‍රමාණය අනුව පොළිය බැංකුව විසින් ගෙවිය යුතු ය. එසේ උපචිත වන පොළිය, ඔහු තැන්පතුව කළ දිනයෙන් එක් මාසයක කාලයක් ඉකුත්වීමෙන් පසු එම තැනැත්තා විසින් ආපසු ලබාගත හැකි ය.

8. මේ පනත අදාළ වන්නා වූ ද 3 වන වගන්තියේ සඳහන් යම් විශේෂ ගිණුමක මුදල් කිසිවක් තැන්පත් කර ඇත්තා වූ ද, යම් තැනැත්තකු- ඇතැම් බදුවලින් සහ නඩු පැවරීම් වලින් නිදහස් කිරීම.

(අ) (i) ඒ විශේෂ ගිණුමේ තැන්පත් කරන ලද මුදල්වලින් දැක්වෙන, ඔහුගේ ලාභ සහ ආදායමේ යම් කොටසක් මත 1996 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර හෝ ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ආදායම් බදු පැනවීමට තත්කාලයෙහි අදාළ නීතිය යටතේ සහ ආදායම් බද්ද මත අධිභාරය පැනවීමට තත්කාලයෙහි අදාළ නීතිය යටතේ, පිළිවෙලින් යම් ආදායම් බද්දක් හෝ ආදායම් බද්ද මත අධිභාරයක් ගෙවීමට යටත් නොවිය යුතු ය:

(ii) (i) වන අනුඡේදයෙහි සඳහන් ඔහුගේ ලාභ සහ ආදායමේ යම් කොටසක් යෙදවීම මගින් අත්කර ගන්නා ලද ඔහුගේ ශුද්ධ ධනයේ කොටස වෙනුවෙන් ධන බද්ධ පැනවීමට තත් කාලයෙහි අදාළ නීතිය යටතේ සහ ධන බද්ද මත අධිභාරය පැනවීමට තත් කාලයෙහි අදාළ නීතිය යටතේ, 1996 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ගෙවිය යුතු, පිළිවෙලින් යම් ධන බද්දක් හෝ ධන බද්ද මත අධිභාරයක් ගෙවීමට යටත් නොවිය යුතු ය :

(iii) (i) වන අනුඡේදයෙහි සඳහන් ඔහුගේ ලාභ සහ ආදායමේ කොටස උපචිත වූයේ නැතහොත් පැන නැගුනේ පිරිවැටුමක යම් කොටසකින් ද ඒ පිරිවැටුමේ කොටස වෙනුවෙන් 1963 අංක 11 දරන මුදල් පනත යටතේ යම් ව්‍යාපාර පිරිවැටුම් බද්දක් හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත යටතේ යම් පිරිවැටුම් බද්දක් හෝ 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත යටතේ යම් ජාතික ආරක්ෂක බද්දක් ගෙවීමට යටත් නොවිය යුතු ය ; හෝ

(ආ) (i) (අ) ඡේදයේ (i) වන අනුඡේදයෙහි සඳහන් ඔහුගේ ලාභ සහ ආදායමේ මේ කොටස හෝ (අ) ඡේදයේ (ii) වන අනුඡේදයෙහි සඳහන් ඔහුගේ ශුද්ධ ධනයේ කොටස වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් 1996 මාර්තු මස 31 වන දින හෝ එදිනට පෙර අවසාන වන යම් තක්සේරු වර්ෂයකට අදාළව ආදායම්

බද්ද හෝ ආදායම් බද්ද මත අධිභාරය හෝ ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාරය පැනවීමට තත්කාලයෙහි අදාළ නීතිය යටතේ යම් වරදක් සඳහා නඩු පැවරීමකට හෝ දණ්ඩනයකට යටත් නොවිය යුතු ය ;

(ii) (අ) ඡේදයේ (iii) වන අනුඡේදයෙහි සඳහන් ඔහුගේ පිරිවැටුමේ කොටස වෙනුවෙන් හෝ ඒ සම්බන්ධයෙන් 1963 අංක 11 දරන මුදල් පනත හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනත හෝ 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක බදු පනත යටතේ යම් වරදක් සඳහා නඩු පැවරීමකට හෝ දණ්ඩනයකට යටත් නොවිය යුතු ය ;

(iii) ඔහු විසින් පරිවර්තනය කර එම විශේෂ ගිණුමෙහි තැන්පත් කරන ලද සම්පූර්ණ අදාළ විදේශ ව්‍යවහාර මුදල හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් විනිමය පාලන පනත යටතේ යම් වරදක් සඳහා නඩු පැවරීමකට හෝ දණ්ඩනයකට යටත් නොවිය යුතු ය.

මේ පනතේ ඉහතින් වූ විධිවිධාන, ඇතුළත් කරන ලද යම් තක්සේරුවක් ප්‍රතිශෝධනය කිරීමට බලය දෙන විධිවිධාන ලෙස තේරුම් ගනු නොලැබිය යුතු බව.

9. මේ පනතේ ඉහතින් වූ විධිවිධානවල ඇතුළත් කිසිවකින්-

(අ) (i) ආදායම් බද්ද හෝ ආදායම් බද්ද මත වූ අධිභාරය හෝ ධන බද්ද හෝ ධන බද්ද මත වූ අධිභාරය පැනවීමට අදාළ තත් කාලයෙහි නීතියේ ; හෝ

(ii) 1963 අංක 11 දරන මුදල් පනතෙහි හෝ 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතේ හෝ 1991 අංක 52 දරන ජාතික ආරක්ෂක පනතේ ;

විධිවිධාන යටතේ කරන ලද, එවැනි යම් නීතියක් හෝ පනතක් යටතේ අවසානාත්මකව හා තීරණාත්මකව ඇති, යම් තක්සේරුවක් ;

(ආ) මේ පනත අදාළ වන යම් තැනැත්තකු වෙත, ඔහු විසින් විනිමය පාලන පනතේ යම් විධිවිධානයන් උල්ලංඝනය කිරීමට අදාළව, 1996 මාර්තු මස 31 වන දිනට පෙර පනවන ලද, එවැනි යම් නීතියක් යටතේ අවසානාත්මකව හා තීරණාත්මකව ඇති, යම් නියමයක් ; හෝ

(ඈ) එවැනි යම් නීතියක් යටතේ අවසානාත්මකව හා තීරණාත්මකව ඇති වෙනත් යම් කාරණයක්

ප්‍රතිශෝධනය කිරීමට බලය ලැබෙන්නේ යයි කියවා තේරුම් ගනු නොලැබිය යුතු ය.

රහස්‍යතාව රැකීම.

10. (1) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ හෝ බැංකුවේ සෑම නිලධරයකු හෝ සේවා නියුක්තයකු විසින් ම, මේ පනත පරිපාලනය කිරීමෙහි ලා තමන්ට දැනගන්නට ලැබෙන සියලු කාරණා සම්බන්ධයෙන් රහස්‍යතාව රැකීම හා රහස්‍යතාව රැකීමෙහි ලා ආධාර කිරීම කළ යුතු අතර, 3 වන වගන්තියේ සඳහන් එවැනි යම් විශේෂ ගිණුමක් පිළිබඳ කවර වූ හෝ තොරතුරක්, යම් පුද්ගලයකුට, සංස්ථාවකට, බැංකුවකට, අධිකරණයකට, ආයතනයකට, අස්තිත්වයකට, දෙපාර්තමේන්තුවකට, නිලධරයකුට, අනුයෝජිතයකුට, ශ්‍රී ලංකා ආණ්ඩුවේ නියෝජිතයකුට හෝ වෙනත් යම් නෛතික හෝ ස්වාභාවික තැනැත්තකුට දීම, හෙළි කිරීම හෝ අනාවරණය කිරීම, නොකළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, මේ පනත පරිපාලනය කිරීමෙහි ලා තමන්ට දැනගන්නට ලැබෙන යම් කාරණයක් හෝ තොරතුරක් දන්වන ලෙස කොමසාරිස් ජනරාල්වරයාට හෝ විනිමය පාලකවරයාට හෝ බැංකුවේ නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට–

(i) ඒ කාරණය හෝ තොරතුර අදාළ වන තැනැත්තා විසින් :

(ii) යම් අධිකරණයක, විෂ මත් ද්‍රව්‍ය හෝ පැහැර ගෙන යාම හෝ පිළිබඳ වූ ජාත්‍යන්තර සම්මුතියක් ක්‍රියාවේ යෙදවීමේ යම් නීතියක් යටතේ පවරනු ලැබ ඇති යම් අපරාධ නඩු කටයුත්තක දී ඒ නීතියෙහි යම් විධිවිධානයක් මගින් :

(iii) 3 වන වගන්තියේ සඳහන් යම් විශේෂ ගිණුමක ඇති මුදල්, හෝ විදේශ විනිමය 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ වරදක් සමන්විත කරන යම් ක්‍රියාවක් තවදුරටත් කරගෙන යාම පිණිස, යොදා ගෙන ඇති බවට හා දැනටත් යොදා ගන්නා බවට වූ හේතුව මත, ඒ සඳහා වූ ඉල්ලීමක් පිට ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරනු ලබන ඉල්ලීමක් මගින් : හෝ

(iv) 3 වන වගන්තියේ සඳහන් විශේෂ ගිණුමක් දරන තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට විරුද්ධව බැංකුව විසින් හෝ ඊට විරුද්ධව, ඒ ගිණුමෙන් පැන නගින බැංකු ගණුදෙනුවකට අදාළව, පවරන ලද යම් නඩු කටයුත්තක දී අධිකරණයේ ආඥාවක් මගින්

නියම කරනු ලබන්නේ නම්, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා හෝ විනිමය පාලකවරයා විසින් හෝ බැංකුවේ ඒ නිලධරයා හෝ සේවා නියුක්තයා විසින්, ඒ කාරණය හෝ තොරතුර දැන්වීම ඒ නියමයට හෝ අධිකරණ ආඥාවට අනුකූල වීම සඳහා තදින්ම අවශ්‍ය තාක් ප්‍රමාණයට ඒ කාරණය හෝ තොරතුර ඒ තැනැත්තා හෝ අධිකරණය වෙත දන්වනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ විධිවිධානවලට පටහැනිව ක්‍රියා කරන, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ හෝ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ හෝ බැංකුවේ යම් නිලධරයකු හෝ සේවා නියුක්තයකු, මේ පනත යටතේ වරදක් කරන අතර, මහෙස්ත්‍රාත් වරයකු ඉදිරියෙහි පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඔහු යටත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

11. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි–

"බැංකුව" යන්නෙන්, 1971 අංක 30 දරන ජාතික ඉතිරිකිරීමේ බැංකු පනත මගින් පිහිටුවනු ලැබූ ජාතික ඉතිරිකිරීමේ බැංකුව අදහස් වේ ;

"කොමසාරිස් ජනරාල්වරයා", "පළාත් පාලන ආයතනය", "ශුද්ධ ධනය", "ලාභ සහ ආදායම්" සහ "තක්සේරු වර්ෂය" යන යෙදුම්වල 1979 අංක 28 දරන දේශීය ආදායම් පනතෙහි ඒවාට පිළිවෙළින් දී ඇති අර්ථයම ඇත්තේ ය ;

"විනිමය පාලකවරයා" යන්නෙන්, මහ බැංකුවේ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ ප්‍රධානයා වශයෙන් පදවිනාම ගතකර ඇති නිලධරයා අදහස් වන අතර ඔහුගේ සහායකයා වශයෙන් පදවිනාම ගතකර ඇති නිලධරයෙක් ද ඇතුළත් වේ :

"විදේශ විනිමය පනත" යන්නෙන්, (423 වන අධිකාරය වූ) විනිමය පාලන පනත අදහස් වේ :

"විදේශ ව්‍යවහාර මුදල්" යන්නෙන් ශ්‍රී ලංකා ව්‍යවහාර මුදල් හැර යම් ව්‍යවහාර මුදල් වර්ගයක් අදහස් වන අතර තැනැත්තකුගේ විශ්‍රාම වැටුප හෝ ඔහුට ලැබිය යුතු වෙනත් පාරිතෝෂිකයක් වෙනුවෙන් ශ්‍රී ලංකාවෙහි හෝ ශ්‍රී ලංකාවෙහි පදිංචිව සිටින තැනැත්තකුට විදේශීය ආණ්ඩුවක් හෝ ආයතනයක් විසින් ගෙවිය යුතු යම් ව්‍යවහාර මුදල් වර්ගයක් සහ ශ්‍රී ලංකා ව්‍යවහාර මුදලින් හැර වෙනත් යම් ව්‍යවහාර මුදලින් ගෙවිය යුතු සියලු තැන්පතු ණය හා ශේෂයන් ද ශ්‍රී ලංකා ව්‍යවහාර මුදලින් ප්‍රකාශ කර ඇති හෝ ලියා ඇති නමුත් ශ්‍රී ලංකා ව්‍යවහාර මුදලින් හැර වෙනත් යම් ව්‍යවහාර මුදලින් ගෙවිය යුතු එවැනි යම් අණකර, සංචාරක චෙක්පත්, ණයවර ලිපි සහ විනිමය බිල්පත් ඇතුළත් වේ :

"තැනැත්තා" යන්නට සමාගමක්, පුද්ගල මණ්ඩලයක් හෝ හවුල් ව්‍යාපාරයක් ඇතුළත් වේ :

"අදාළ විදේශ ව්‍යවහාර මුදල්" යන්න, යම් තැනැත්තකු සම්බන්ධයෙන් යෙදෙන විට, ඒ තැනැත්තා විසින් විනිමය පාලන පනතේ විධිවිධාන උල්ලංඝනය කරමින් ශ්‍රී ලංකාවෙන් පිටතදී 1996 මාර්තු මස 31 වන දින දරන ලද්දා වූ ද ලාභ සහ ආදායම් වන හෝ ලාභ සහ ආදායමට ආරෝපණය කළ හැකි නැතහොත් ලාභ සහ ආදායම නොවන හෝ ලාභ සහ ආදායමට ආරෝපණය කළ හැකි නොවන ත්‍යාග, ප්‍රදාන හෝ උරුමවීම මගින් හෝ වෙනත් ක්‍රමයකින් ශ්‍රී ලංකාවෙන් පිටත දී හෝ ඔහු විසින් අත්කරගෙන ඇත්තා වූ ද විදේශ ව්‍යවහාර මුදල් අදහස් වේ :

"ආදායම් බද්ද පැනවීමට අදාළ තත්කාලයෙහි නීතිය" යන්නෙන්, 1979 අංක 28 දරන් දේශීය ආදායම් පනත අදහස් වේ :

"ආදායම් බද්ද මත අධිභාරය පැනවීමට අදාළ තත්කාලයෙහි නීතිය" යන්නෙන්, 1982 අංක 26 දරන ආදායම් අධිභාර පනත, 1984 අංක 12 දරන ආදායම් බදු අධිභාර පනත සහ 1989 අංක 7 දරන ආදායම් බදු අධිභාර පනත අදහස් වේ :

"ධන බද්ද හෝ ධන බද්ද මත අධිභාර පැනවීමට අදාළ තත් කාලයෙහි නීතිය" යන්නෙන් 1979 අංක 28 දරන දේශීය ආදායම් පනත, 1982 අංක 25 දරන ධන බදු අධිභාර පනත සහ 1989 අංක 8 දරන ධන බදු අධිභාර පනත අදහස් වේ :

"පිරිවැටුම" හා "කාර්තුව" යන යෙදුම්වල 1981 අංක 69 දරන පිරිවැටුම් බදු පනතෙහි ඒවාට පිළිවෙලින් දී ඇති අර්ථය ම ඇත්තේ ය.

**උපලේඛනය (4 වන වගන්තිය)**

**1997 අංක ............... දරන බදු සහ විදේශ විනිමය සමා පනත**

**4 වන වගන්තිය යටතේ ප්‍රකාශය**

**ආදායම් බදු ලිපිගොනුවක් තිබේ නම් එහි අංකය :-**

**ජාතික හැඳුනුම්පත් අංකය/සමාගම් ලියාපදිංචි අංකය :-**

**විශේෂ සමාලාභී ඉතිරි කිරීමේ තැන්පතු ගිණුම් අංකය :-**

**වෙළෙඳ ව්‍යාපාරයක් තිබේ නම් එහි නාමය :-**

**දිනය :-**

**........................................... හි**

**ලිපිනය**

**.............................................**

**(සම්පූර්ණ නම/නම්)**

**........................ මහතා/මහත්මිය/මෙනෙවිය වන මම/අපි**

(1) 1997 අංක ............ දරන බදු සහ විදේශ විනිමය සමා පනත අනුව

(අ) මා විසින්/සමාගම විසින් ශ්‍රී ලංකාවේ දරන රු :.................

(ආ) මා විසින්/සමාගම විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දරන (අදාළ විදේශ විනිමය නොවන) විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීමෙන් ලබාගත්
රු :............

(ඇ) අදාළ විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීමෙන් ලබාගත් රු :......... වන රු :............ ක මුදලක් .............. හි............... නමින් විශේෂ සමාලාභී ඉතිරි කිරීමේ තැන්පතු ගිණුමක තැබීම සඳහා භාරගන්නා ලෙස ඔබගෙන් ඉල්ලා සිටිමි/සිටිමු.

(2) මේ තැන්පතුවේ දිනයෙන් අවුරුදු දෙකක කාලයක් ඉකුත් වීමට පෙර, ඉහත කී පනතේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තියේ අකුරු විධානයේ නිශ්චිතව සඳහන් කාර්ය සඳහා ද එසේ සඳහන් කාලයක් පසුව ද, හැර, මේ මුදලින් යම් කොටසක් ආපසු ලබා නොගන්නා බවට මම/අපි පොරොන්දු වෙමි/වෙමු.

(3) මගේ/අපගේ විශේෂ සමාලාභී ඉතිරි කිරීමේ තැන්පතු පාස් පොත ඔබගේ බැංකුවේ ආරක්ෂා භාරයේ තැබීමට එකඟ වෙමි/වෙමු.

(4) තත් කාලයෙහි ඔබගේ බැංකුවේ ඉතිරි කිරීමේ තැන්පතුවලට අදාළ වන සහ කලින් කල ක්‍රියාත්මක වන රීතිවලින් බැඳී සිටීමට ද වැඩිදුරටත් මම/අපි එකඟ වෙමි/වෙමු.

තැන්පත්කරුගේ/තැන්පත්කරුවන්ගේ අත්සන/අත්සන්,
සමාගමක් වෙනුවෙන් වූ ප්‍රකාශයක් නම් පදවිනාමය.

මා ඉදිරියේ අත්සන් කරන ලදී.

ශාඛා කළමනාකරුගේ අත්සන.